**ශීර්ෂය 246 - දේශීය ආදායම් දෙපාර්තමේන්තුව**

**-------------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශය 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2019 මැයි 31 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2019 මැයි 31 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ජේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කර ගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

**1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම**

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශයන්ගෙන් තොර බවට තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ආර්ථික තීරණ ගැනීමේදී ඒ පිළිබඳව සැලකිලිමත් විය යුතුය.

වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. මා විසින්,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීමෙන් වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟ හරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම, හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.
- අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේදී, මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව,

මාගේ විගණනයෙන් හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

**1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(ඇ) වගන්තිය හා 38 වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණ මා ප්‍රකාශ කරමි.

(අ) ඉකුත් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ අවශ්‍යතාවයක් නොතිබුණ බැවින් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූපී වන බව ප්‍රකාශ කළ නොහැකි විය.

(ආ) දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් ඉකුත් වර්ෂයට අදාළව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ අවශ්‍යතාවයක් නොතිබුණු බැවින් මූල්‍ය ප්‍රකාශන පිළිබඳ නිර්දේශ ඉදිරිපත් කර නොතිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 මූල්‍ය ප්‍රකාශන චක්‍රලේඛ විධිවිධානවලට අනුකූල නොවීම

2018 නොවැම්බර් 21 දිනැති අංක 267/2018 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතුව තිබුණත්, එම අවශ්‍යතාවයන්ගෙන් බැහැර වූ අවස්ථා පහත දැක්වේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) 2018 නොවැම්බර් 21 දිනැති අංක 267/2018 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ 3.1 ඡේදයේ විධිවිධාන ප්‍රකාරව ආදායම් ලැබීමට අදාළ 2018 වර්ෂයේ අය වැය ගත අගයන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි. | චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව සියළුම තොරතුරු ඇතුළත් කර මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතු බව. | පිළිතුරු ලබා දී නොමැත. |
| (ආ) යථෝක්ත චක්‍රලේඛය මඟින් හඳුන්වා දී ඇති මූල්‍ය ප්‍රකාශන ආකෘතියේ ඒසීඒ-1 ආකෘතිය තුල හිඟ ආදායම් රැස් කිරීමට අදාළ විස්තර හා ඒසීඒ-1(i) ආකෘතියේ වර්ෂයේ ආරම්භක හිඟ බදු ශේෂ දක්වා නොතිබුණි. තවද, හිඟ බදු, ආදායම් සංකේත අනුව වෙන් කර දක්වා නොතිබුණි. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ ආකෘතියේ ඇතුළත් සියළුම විස්තර ඇතුළත් කර මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතු බව. | |

### 1.6.2 මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) දෙපාර්තමේන්තුව විසින් රැස් කරනු ලබන එකතු කිරීමේ අගය මත බදු ආදායම භාණ්ඩාගාරයේ පවත්වා ගෙන යන පාලන ගිණුමට බැර වේ. එසේ බැරවන මුදල් මාසික ගිණුම් සාරාංශ මඟින් මූල්‍ය සේවා, අනෙකුත් සේවා හා නිෂ්පාදන යන එකතු කිරීමේ අගය මත බදු ආදායම් සංකේත තුන වෙත ගිණුම් ගත කිරීම සිදු වේ. මාසික ගිණුම් සාරාංශ මඟින් ගිණුම් ගත කිරීමෙන් පසුව සමාලෝචිත වර්ෂයේ අවසානයට පාලන ගිණුමේ ඉතිරි වී පැවති රු.8,606,788 ක මුදල ආදායම් සංකේත අනුව හඳුනා ගැනීමෙන් තොරව එකතු කිරීමේ අගය මත බදු අනෙකුත් සේවා ආදායම් සංකේතයට මාරු පත්‍රයක් මඟින් බැර කර | ආදායම නිවැරදිව හඳුනාගෙන සංකේත අනුව වර්ගීකරණය කර නිවැරදි ආදායම් සංකේතයට බැර කළ යුතු බව | පිළිතුරු ලබාදීම සඳහා මාස 2 ක කාලයක් ඉල්ලා ඇත. |

| | | |
|---|---|---|
| තිබුණි. ඒ අනුව නිවැරදි ආදායම් සංකේතය හඳුනා නොගැනීම නිසා අදාළ ආදායම් සංකේත තුනෙහිම ශුද්ධ ආදායමේ නිරවද්‍යතාව විගණනයේ දී තහවුරු නොවීය. | | |
| (ආ) මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ රැස් කළ කොටස් ගනුදෙනු බද්ද රු.1,196,346,653 ක් වුව ද කොළඹ කොටස් හුවමාරු මධ්‍යස්ථානයෙන් ලබාගෙන දෙපාර්තමේන්තුව විසින් විගණනයට ඉදිරිපත් කළ තොරතුරු අනුව එම අගය රු.1,200,413,567 ක් වූයෙන් රු.4,066,914 ක නොසැසඳීමක් විය. එම නොසැසඳීමට අදාළ හේතු හඳුනා ගෙන නිවැරදි කිරීමට පියවර ගෙන තිබුණ බව නිරීක්ෂණය නොවිය. | රැස් කිරීමේ ගිණුමට බැරවන ආදායම, වාර්තා සමඟ සසඳා අනාවරණය වන නොසැසඳීම් අදාළ අංශ දැනුවත් කර කාලීනව විසඳා ගත යුතු බව. | මාසය අවසානයට සිදුවන ලැබීම් එළඹෙන මස ආරම්භයේ දී ගිණුම් ගත වන බැවින් මෙම වෙනස ඇති විය හැකි බව දන්වා තිබුණි. |
| (ඇ) වාහන හිමිකම් බද්දට අදාළ විවෘත කළ ණයවර ලිපි සංඛ්‍යාව පිළිබඳ දෙපාර්තමේන්තුව විසින් විගණනයට ලබා දුන් තොරතුරු පදනම් කර ගෙන වාහන කාණ්ඩය අනුව විගණනය විසින් සිදු කල ගණනය කිරීමේ දී සමාලෝචිත වර්ෂයේ වාහන හිමිකම් බද්ද රු.2,695,261,000 ක් වුව ද මූල්‍ය ප්‍රකාශන අනුව වාහන හිමිකම් බද්ද රු.2,191,685,363 ක් වූයෙන් රු.503,575,637 ක නොසැසඳීමක් නිරීක්ෂණය විය. | | මාසිකව බැංකුවට බැර වන බදු මුදල හා රේගු දෙපාර්තමේන්තුවෙන් ලබා ගන්නා වාර්තා අතර වෙනස් කම් පවතින බවත් ඊට අදාළ හේතු හඳුනා ගැනීමට කටයුතු කරන බවත් වාර්තා කර ඇත. |
| (ඈ) ආදායම් රැස් කිරීමේ බැංකු ගිණුම් මඟින් භාණ්ඩාගාරයට බැර වන මුදල් , බැංකු ගිණුම් ප්‍රකාශ සමඟ සසඳා වෙනස්කම් හඳුනා ගැනීමට හා ඒවා නිවැරදි කිරීමට කාලීනව පියවර ගෙන නොතිබුණු බව නිරීක්ෂණ වීය. | | අදාළ අඩු පාඩු වැඩ අයිතම ලෙස නිලධාරීන් වෙත යොමු වීමත් ඒවා නිම කිරීම සඳහා මාස 2 ක පමණ කාලයක් ගත වන බවත් දන්වා තිබුණි. |

### 1.6.3 මූල්‍ය තත්ත්ව ප්‍රකාශය

**(අ)**ස්ථාවර වත්කම්

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| මුදල් රෙගුලාසි 502(2) ප්‍රකාරව යාවත්කාලීන කළ ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා නොතිබුණ අතර භාණ්ඩ සමීක්ෂණය සිදු කර වත්කම් පිළිබඳ නිසි | භාණ්ඩ සමීක්ෂණය සිදු කර සියළුම වත්කම් සත්‍යාපනය කර සිගාස් පරිගණක පද්ධතියෙන් | 2019 ජූලි 31 දිනට යාවත් කාලීන කරන ලද වාර්තාවක් විගණනය |

| | | |
|---|---|---|
| තහවුරුවකින් තොරව සිගාස් වැඩසටහනින් ලබා ගත් තොරතුරු ආශ්‍රයෙන් දේපළ පිරියත හා උපකරණ වටිනාකම සමාලෝචිත වර්ෂයේ දී මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. එහෙත් සිගාස් වැඩසටහන තුළින් ලබාගත් තොරතුරු ඇතුළත් ලේඛන විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | ලබාගත් වාර්තා සමඟ හෝ ස්ථාවර වත්කම් ලේඛන සමඟ සසඳා නිරවද්‍යතාවය තහවුරු කර මූල්‍ය ප්‍රකාශනවල දැක්වීම. | වෙත ඉදිරිපත් කරන බව. |

**(ආ) රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසැඳුම් ප්‍රකාශය**

පහත සඳහන් නිරීක්ෂණයන් සිදු කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (i) මිය ගිය හා සේවය හැර ගිය නිලධාරීන් 04 දෙනෙකුට අදාළ එකතුව රු.614,335 ක හිඟ ණය ශේෂය සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් නිරවුල් වී නොතිබුණි. | හිඟ ණය ශේෂ අය කර ගැනීම සඳහා කඩිනමින් පිය වර ගැනීම. | නීතිමය පියවර ගැනීම මගින් ණය ශේෂ අය කර ගැනීම සඳහා පියවර ගන්නා බව. |
| (ii) හිඟ හිට ඇති කාල සීමාව වසර 20 ඉක්ම වී ඇති එකතුව රු.189,773 ක ණය ශේෂ පැවති අතර එම ණය ශේෂයන්ට අදාළ ලිපි ගොනු හෝ ලේඛන කිසිවක් විගණනයට ඉදිරිපත් නොවීය. | අදාළ විස්තර සොයා ණය කරුවන් පිළිබඳ විස්තර ලබා ගෙන අය කිරීමට කටයුතු කිරීම. | 2008 වර්ෂයේ සිදු වූ ත්‍රස්ත ප්‍රහාරය හේතුවෙන් ලිපි ගොනු විනාශ වී ඇති බව හා ගත යුතු ඉදිරි ක්‍රියාමාර්ග පිළිබඳව මුදල් අමාත්‍යාංශයේ අදාළ අංශ වෙතින් විමසීම් කර ඇත. |

**(ඇ) තැන්පතු**

මූල්‍ය ප්‍රකාශනවලට අදාළ තැන්පත් ගෙවීම් හා ශේෂ ගිණුම්ගත කිරීමේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (i) පොදු තැන්පත් ගිණුම් 04 ක පවතින වසර 02 ඉක්ම වූ එකතුව රු.714,562,813 ක තැන්පතු ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571(2) ප්‍රකාරව කටයුතු කර නොතිබුණ බව නිරීක්ෂණය විය. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු බව. | අදාළ ශේෂ නිරවුල් කිරීමෙන් පසු 2019 මැයි 30 දිනට තව දුරටත් නිරවුල් කළ යුතු ශේෂය රු.464,562,814 ක් බව වාර්තා කර ඇත. |
| (ii) 2015 ජුනි 24 දිනැති අංක 243/2015 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය 5.1(අ) හා 5.2 | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු බව. | කඩිනමින් නිරවුල් කිරීමට කටයුතු කරන බව |

| | | |
|---|---|---|
| ප්‍රකාරව නිශ්චිත ආදායම් සංකේත යටතේ හඳුනා ගත හැකි සියලුම ලැබීම් අදාළ ආදායම් සංකේතයට බැර කළ යුතු වුවත් එකතුව රු.1,141,170 ක ලැබීම් අදාළ ආදායම් සංකේතයට බැර කිරීමෙන් තොරව සමාලෝචිත වර්ෂය අවසානය දක්වාත් පොදු තැන්පත් ගිණුමක රඳවා ගෙන තිබුණි. | | දන්වා තිබුණි. |

## 1.6.4 හිඟ ආදායම් පිළිබඳ ප්‍රකාශය

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) ඉකුත් වර්ෂයේ හිඟ බදු වාර්තාව අනුව, එකතු කල අගය මත බදු (මූල්‍ය සේවා) හා ජාතිය ගොඩනැගීමේ බදු (මූල්‍ය සේවා) ආදායම් සංකේතවලට අදාළව පිළිවෙළින් රු.11,797,951,411 ක හා රු.581,903,358 ක හිඟ බදු පැවතිය ද සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ දී එම ශේෂ අත්හැර තිබුණි. | මූල්‍ය ප්‍රකාශන හා හිඟ බදු වාර්තා පිළියෙල කිරීමේ දී ගිණුම් ශේෂ අත්හැරීම් සිදු නොවන බව තහවුරු කර ගැනීමේ පාලන ක්‍රම වේද සකස් කර ගැනීම | හිඟ ශේෂ ඇතුළත් කර සංශෝධිත හිඟ බදු වාර්තාවක් ඉදිරිපත් කරන බව දන්වන ලදී. |
| (ආ) 2015 අංක 10 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව 2015 නොවැම්බර් 15 හෝ ඊට පෙර එක් ආයතනයකින් රු.මිලියන 1,000 බැගින් කැසිනෝ ව්‍යාපාර 04 කින් එකතුව රු.මිලියන 4,000 ක කැසිනෝ කර්මාන්ත අය බදු රැස් කළ යුතු වුවත් සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් ඉන් රු.මිලියන 1,025 ක් පමණක් රැස් කර ගෙන තිබුණි. ඒ අනුව, තවදුරටත් අය විය යුතු රු.මිලියන 2,975 ක මුදල සමාලෝචිත වර්ෂයේ දී හිඟ බදු ලෙස වාර්තා කර නොතිබුණි. | පනතේ විධිවිධාන ප්‍රකාරව හිඟ බදු අය කර ගැනීමත් මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ දී සියළුම හිඟ බදු ඇතුළත් කිරීමත් සිදු කළ යුතු බව. | බදු අය කර ගැනීමේ ප්‍රගතිය වාර්තා කර ඇත. |
| (ඇ) විගණනයට ඉදිරිපත් කළ හිඟ බදු වාර්තා අනුව, සමාලෝචිත වර්ෂය අවසානයට දළ හිඟ හා දඩ මුදලේ එකතුව රු.බිලියන 1,608.2 ක් විය. එම මුදලින් අය කර ගත හැකි හිඟ බදු ලෙස හඳුනා ගෙන ඇති රු.බිලියන 287.5 ක් පමණක් සමාලෝචිත වර්ෂයට අදාළ හා වර්ෂය අවසාන දිනට හිඟ බදු ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. අය කිරීම් තාවකාලිකව අත්හිටුවා ඇති රු.බිලියන 1,320.6 හිඟ බදු පිළිබඳ විස්තර මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර | මූල්‍ය ප්‍රකාශන තුල හිඟ බදු වාර්තා කිරීමේ පදනම ගිණුම්කරණ ප්‍රතිපත්ති තුල අනාවරණය කළ යුතු බව හා තාවකාලිකව අත්හිටුවා ඇති හිඟ බදු හා දඩ මුදල පිළිබඳව මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කළ යුතු බව. | 2018 දෙසැම්බර් 31 දිනට දෙපාර්තමේන්තුව විසින් ඉදිරිපත් කළ හිඟ බදු වාර්තාව දෝෂ සහිත බව |

නොතිබුණි.

**1.6.5 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම**

දෙපාර්තමේන්තුව විසින් පහත දැක්වෙන ඇතැම් ලේඛන පවත්වා නොතිබුණු අතර, ඇතැම් ලේඛන විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| **උප පත්‍රිකා පොත් ලේඛනය**<br>මුදල් රෙගුලාසි 341 ප්‍රකාරව උප පත්‍රිකා ලේඛනයක් පවත්වා තිබුණ ද එය යාවත් කාලීන කර නොතිබුණි. | මුදල් රෙගුලාසි 341 හි විධිවිධාන ප්‍රකාරව ජී.ඒ.එන් 20 ආකෘතිය ප්‍රකාරව උප පත්‍රිකා පොත් ලේඛනයක් යාවත්කාලීනව පවත්වා ගත යුතුය. | දැනට පවත්නා ශේෂ පදනම් කරගෙන උප පත්‍රිකා ලේඛණය පවත්වා ගෙන යන බව දන්වා ඇත. |
| **ප්‍රසම්පාදන කමිටුවේ හා තාක්ෂණ ඇගැයීම් කමිටුවල පැමිණීමේ ලේඛනය**<br>රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.11.2 මාර්ගෝපදේශය ප්‍රකාරව කමිටුවේ ලේකම්වරයා විසින් පැමිණීමේ ලේඛනයක් පවත්වා නොතිබුණි. | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.11.2 මාර්ගෝපදේශය ප්‍රකාරව කමිටුවේ ලේකම්වරයා විසින් පැමිණීමේ ලේඛනයක් පවත්වා ගත යුතුය. | 2019 ජනවාරි සිට ලේඛණයක් පවත්වා ගෙන යන බව දන්වා ඇත. |

**1.6.6 විගණන සාක්ෂි නොවීම**

පහත සඳහන් විගණන සාක්ෂි ඉදිරිපත් කර නොතිබුණි.

| නිරීක්ෂණය | නිර්දේශය | දෙපාර්තමේන්තුවේ අදහස් දැක්වීම |
|---|---|---|
| දෙපාර්තමේන්තුව සමාලෝචිත වර්ෂයේදී ඉදිරිපත් කරන ලද විගණන විමසුම් 6 කට 2019 මාර්තු 31 දින වන විටද පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණු අතර, එම විමසුම්වලට අදාල ගණනය කළ හැකි ගනුදෙනුවල වටිනාකම රු.67,676,679 ක් විය. | මුදල් රෙගුලාසි 155 ප්‍රකාරව ගණන්දීමේ නිලධාරියා විසින් මුදල් රෙගුලාසි 452(1) හි සඳහන් විගණන විමසුම් ලේඛනය නියමිත කාලයකට පසුව පරීක්ෂා කර බලා ලැබී ඇති විගණන විමසුම්වලින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කිරීමට කටයුතු කළ යුතු අතර, එම විමසුම්වලට වහාම පිළිතුරු ලබා දිය යුතුය. එසේ පිළිතුරු ලබා දීම ප්‍රමාද විය හැකි විමසුම් වෙනම් ඒ සඳහා අතුරු වාර්තාවක් යැවීමට කටයුතු කළ යුතුය. | අතුරු පිළිතුරක් ලබා දී ඇති අතර විමසුමට අදාළ බදුකරුවන් සම්බන්ධ පරීක්ෂා කිරීමට නිලධාරීන් සඳහා වැඩ අයිතම නිකුත් කර ඇති බව |

### 1.6.7 ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතිකවීම්

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව ගණන්දීමේ නිලධාරී විසින් පහත සඳහන් කරුණ සම්බන්ධයෙන් සහතික වීම් කළ යුතුව තිබුණත්, ඒ අනුව කටයුතු කර නොතිබුණි.

| **නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදු කර ඒ අනුව පද්ධති ඵලදායි ලෙස කර ගෙන යෑමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය. එම සමාලෝචනයන් ලිඛිතව සිදු කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයන් සිදු කළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. | කළමණාකරණ විගණන දෙපාර්තමේන්තුවේ උපදෙස් පරිදි වාර්තාවක් සකස් කළ බව. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 ආදායම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් සිදු කෙරේ.

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| (අ) මුදල් රෙගුලාසි 85(1)(ඇ) හා මුදල් රෙගුලාසි 128(2)(අ) ප්‍රකාරව ආදායම් ඇස්තමේන්තු සම්පූර්ණ ලෙසත්, හැකිතාක් තාත්වික සහ නිවැරදි ලෙසත් පිළියෙල කිරීමට රාජ්‍ය ආදායම් ගණන්දීමේ නිලධාරීන් උත්සාහ දැරිය යුතු විය. එහෙත් සමාලෝචිත වර්ෂයේ දේශීය ආදායම් දෙපාර්තමේන්තු වාර්ෂික ආදායම් ඇස්තමේන්තුව රු.බිලියන 1,028 ක් වුව ද තත්‍ය රැස් කිරීම රු.බිලියන 853.9 ක් වූයෙන් රු.බිලියන 174.1 ක විචලනයක් පැවති අතර එය ඇස්තමේන්තු ගත ආදායමින් සියයට 16.9 ක් විය. ඒ අනුව ආදායම් ඇස්තමේන්තු කිරීම විධිමත් පරිදි සිදු කර නොතිබුණ බව නිරීක්ෂණය විය. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර ආදායම් ඇස්තමේන්තු හැකිතාක් නිවැරදිව පිළියෙල කිරීමට කටයුතු කළ බව. | මූලික ආදායම් ඇස්තමේන්තු අගයන් භාණ්ඩාගාරය විසින් ලබා දෙන බව. |
| (ආ) දෙපාර්තමේන්තුව විසින් ආදායම් සංකේත 5 ක් | මුදල් රෙගුලාසි ප්‍රකාරව | මෙම ආදායම් සංකේත |

| | | |
|---|---|---|
| යටතේ ආදායම් ඇස්තමේන්තු කර නොතිබුණත්, සමාලෝචිත වර්ෂය අවසන් වන විට එම ආදායම් සංකේත 5 යටතේ රු.මිලියන 156.1 ක ආදායමක් රැස් කර තිබුණි. | කටයුතු කර ආදායම් ඇස්තමේන්තු හැකිතාක් නිවැරදිව පිළියෙල කිරීමට කටයුතු කළ යුතු බව. | යටතේ හිඟ බදු හා දඩ පමණක් අයවන බව. |
| (ඇ) 2018 දෙසැම්බර් 31 දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කළ හිඟ බදු වාර්තාව අනුව, Legacy පද්ධතියේ අත්හිටුවා ඇති හිඟ බදු හා දඬ ශේෂය ඉකුත් වර්ෂයට සාපේක්ෂව රු.බිලියන 291.6 සිට රු.බිලියන 128.8 දක්වා රු.බිලියන 162.7 කින් අඩු වී තිබුණි. එහෙත් නව බදු පරිපාලන පද්ධතියේ ඉකුත් වර්ෂයේ අත්හිටුවා ඇති හිඟ බදු ශේෂ නොතිබුණ අතර සමාලෝචිත වර්ෂය අවසන් වන විට එම ශේෂය රු.බිලියන 1,191.7 දක්වා ඉහළ ගොස් තිබුණි. | තාවකාලිකව අත්හිටුවා ඇති හිඟ බදු මුදල්, ඒවා අත්හිටුවීමට තුඩු දී ඇති කරුණු පරීක්ෂා කර කඩිනමින් නිරවුල් කිරීමට කටයුතු කළ යුතු බව. | **Legacy** පද්ධතිය යටතේ පවතින හිඟ බදු අය කර ගැනීම සඳහා කටයුතු කරමින් පවතින බව සහ නව බදු පද්ධතියට අදාළව ඉකුත් වර්ෂයේ අත්හිටවූ බදු වාර්තා වී නොතිබුණ බව. |
| (ඈ) හිඟ බදු වාර්තා අනුව, සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට Legacy පද්ධතිය යටතේ අය කර ගත හැකි බදු මුදල ඉකුත් වර්ෂයට සාපේක්ෂව රු.බිලියන 32 සිට රු.බිලියන 147.2 දක්වා ඉහළ ගොස් තිබුණ අතර නව බදු පරිපාලන පද්ධතියේ (RAMIS) අය කර ගත හැකි බදු ශේෂය රු.බිලියන 17.8 සිට රු.බිලියන 140.3 දක්වා ඉහළ ගොස් තිබුණි. අය කර ගත හැකි බදු ප්‍රමාණය ඉහළ ගොස් තිබුණ ද ඒවා අය කර ගැනීම සඳහා දෙපාර්තමේන්තුව විසින් කඩිනම් පියවර ගෙන නොතිබුණ බව නිරීක්ෂණය විය. | අය කර ගත හැකි හිඟ බදු මුදල් කඩිනමින් අය කර ගැනීමට කටයුතු කළ යුතු බව | හිඟ බදු අයකර ගැනීමේ කටයුතු සිදු කරමින් පවතින බව. |
| (ඉ) 2010 අංක 16 දරන ගෙවීම් පැහැර හරින ලද බදු පියවීමේ (විශේෂ විධිවිධාන) පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ අය කර ගත හැකි හිඟ බදු මුදලේ වැඩි වීම සියයට 3 වඩා අඩුවෙන් හෙවත් රු.බිලියන 23.7 ට වඩා අඩුවෙන් පවත්වා ගෙන යා යුතු වුවත් සමාලෝචිත වර්ෂයේ එම ශේෂය රු.බිලියන 130.5 ක් විය. ඒ අනුව, දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයා විසින් පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කර නොතිබුණ බව නිරීක්ෂණය විය. | පනතේ විධිවිධානවලට අනුකූලව කටයුතු කර අය කර ගත හැකි හිඟ බදු ශේෂ අය කර පනතට අනුගත විය යුතු බව. | 2018 දෙසැම්බර් 31 දිනට හිඟ බදු වාර්තාව දෝෂ සහිත බැවින් සංශෝධනය කිරීමට කටයුතු කරන බව. |
| (ඊ) 2015 නොවැම්බර් 01 දින සිට බලපැවැත්වෙන පරිදි ස්ථිරවම රට හැර යන සෑම ශ්‍රී ලාංකික පුරවැසියෙකුගෙන්ම එම පුරවැසියාට රටින් පිටතට ගෙන යාම සඳහා නිදහස් කරන ලද විදේශ විනිමය මත සියයට විස්සක විගමන බද්දක් අය කිරීමේ විධිවිධාන පනවා ඇති අතර සමාලෝචිත වර්ෂයේ දී | බදු පදනම නිවැරදිව හඳුනා ගැනීමේ ක්‍රමවේදයක් සකස් කර ගැනීමට කටයුතු කළ යුතු බව. | බදු පදනම හඳුනා ගැනීමේ ක්‍රමවේදයක් සකස් කරන බව. |

විගමන බද්ද ලෙස රු.16,682,442 ක් රැස් කර තිබුණි. එහෙත් ආගමන විගමන දෙපාර්තමේන්තුව හා විනිමය පාලන දෙපාර්තමේන්තුව සමඟ සම්බන්ධ වී ස්ථිරවම රට හැර යන පුද්ගලයින් හඳුනා ගැනීම සහ ඔවුන් විසින් රටින් බැහැරට ගෙන යන විදේශ විනිමය ප්‍රමාණය නිශ්චය කර බදු පැහැදම වැඩි කර ගැනීමේ යාන්ත්‍රණයක් හෝ ක්‍රමවේදයක් සකස් කර ගැනීමට දෙපාර්තමේන්තුවේ අවධානය යොමු වී නොතිබුණි.

**2.2 වියදම් කළමනාකරණය**

පහත සඳහන් නිරීක්ෂණයන් සිදු කෙරේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) මුදල් රෙගුලාසි 50(II) ප්‍රකාරව වාර්ෂික වියදම් ඇස්තමේන්තු හැකිතාක් දුරට සම්පූර්ණයෙන් හා නිවැරදිව පිළියෙල කර ඇති බවට ගණන්දීමේ නිලධාරියා වග විය යුතු වුව ද සමාලෝචිත වර්ෂයේ අතිරේක ප්‍රතිපාදන ලබා ගැනීමෙන් හා මුදල් රෙගුලාසි 66 හා 69 මාරු කිරීම් මඟින් වැය විෂයයන් 10 ක අයවැය ඇස්තමේන්තු ප්‍රතිපාදනය සියයට 13 සිට සියයට 125 දක්වා වූ පරාසයකින් වෙනස් කර තිබුණ බව නිරීක්ෂණය විය. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර ඇස්තමේන්තු හැකිතාක් නිවැරදිව හා සම්පූර්ණව පිළියෙල කළ යුතු බව. | ඉල්ලුම් කළ ප්‍රතිපාදන නොලැබීම, ලබා දී ඇති ප්‍රතිපාදන සීමාව තුල කටයුතු කිරීම,මූලධන වැය විෂයන් සඳහා පළමු කාර්තු ගෙවීම් සිදු කිරීමට නොහැකි වීම වැනි කරුණු ප්‍රතිපාදන ඉතිරියට බල පෑ බව. |
| (ආ) මූලධන වැය විෂයන් 3 ක් සඳහා සමාලෝචිත වර්ෂයේ ඇස්තමේන්තුවෙන් වෙන් කර දී තිබූ එකතුව රු.මිලියන 15.5 ක ශුද්ධ ප්‍රතිපාදනයෙන් කිසිඳු මුදලක් උපයෝජනය කර නොතිබුණි. තවද, මූලධන වැය විෂයන් 06 ක් හා පුනරාවර්තන වැය විෂයන් 04 ක් සඳහා ලබා දී තිබුණ එකතුව රු.මිලියන1,456.6 ක ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු.739.2 ක් පමණක් උපයෝජනය කර තිබුණ හෙයින් ඉතිරිවීම් රු.මිලියන 717.3 ක් වූ අතර එම ඉතිරි වීම් ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 11 සිට සියයට 68 ක් දක්වා වූ පරාසයක ප්‍රමාණයක් විය. | ක්‍රියාකාරී සැලැස්ම හා ප්‍රසම්පාදන සැලැස්ම නිසි පරිදි සකසා ප්‍රතිපාදන ඵලදායී ලෙස උපයෝජනය කළ යුතු බව. | ප්‍රාග්ධන ස්වරූපයේ අලුත් වැඩියාවන් ඇති නොවීම හා ප්‍රසම්පාදන කටයුතු අවසන් නොවීම වැනි හේතු ප්‍රතිපාදන ඉතිරියට බලපා ඇති බව |

**2.3 තැන්පත් ශේෂයන්**

පහත සඳහන් නිරීක්ෂණය සිදු කෙරේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2016 වර්ෂයේ සිට 2018 දෙසැම්බර් 31 දින දක්වා කාල පරිච්ඡේදය තුල දී ලැබී ඇති එකතුව රු.මිලියන 2,813.8 ක මුද්දර බදු ආදායම් පළාත් සභා වෙත ප්‍රේෂණය කිරීමෙන් තොරව පොදු තැන්පත් ගිණුමක රඳවා ගෙන තිබුණි. | තැන්පත් ගිණුමේ රඳවා ගෙන ඇති මුදල් පළාත් සභා වෙත ප්‍රේෂණය කල යුතු බව | 2019 මැයි 25 දින වන විට මෙම ශේෂයෙන් රු.මිලියන 500 ක් නිරවුල් කර ඇති බව. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 සැලැසුම් කිරීම**

පහත සඳහන් නිරීක්ෂණයන් සිදු කෙරේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) දෙපාර්තමේන්තුව විසින් සමාලෝචිත වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙළ කර තිබුණද එය 2014 පෙබරවාරි 17 දිනැති අංක 1/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය විධිවිධාන ප්‍රකාරව වාර්ෂික අය වැය පදනම් කර ගත් ප්‍රමුඛතා අනුව සකස් කර නොතිබුණ බව නිරීක්ෂණය විය. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කර විධිමත් ක්‍රියාකාරී සැලැස්මක් සකස් කළ යුතු බව | පිළිතුරු ලබා දී නොතිබුණි. |
| (ආ) සමාලෝචිත වර්ෂය සඳහා දෙපාර්තමේන්තුවේ කාර්ය සාධනය මැනීමට මූලික කාර්ය සාධන දර්ශක (KPI) ස්ථාපිත කර නොතිබුණ අතර අංශ සඳහා ආදායම් රැස් කිරීමේ ඉලක්ක ලබා දී තිබුණි. විගණනයට ඉදිරිපත් කල තොරතුරු අනුව, ආදායම් ඉලක්ක හා ඒවා රැස් කිරීමේ ප්‍රගති වාර්තා පරීක්ෂාවේ දී අංශ හා ප්‍රාදේශීය කාර්යාල 33 ක ආදායම් ඉලක්ක සපුරා ගැනීම සියයට 7 සිට සියයට 95 අතර පරාසයක විය. | දෙපාර්තමේන්තුවේ කාර්ය සාධනය මැනීම සඳහා මූලික කාර්යසාධන දර්ශක ස්ථාපිතකර ඒ අනුව කාර්ය සාධනය ඉහල නංවා ගැනීමට කටයුතු කල යුතු බව. | |

**3.2 වාර්ෂික කාර්යසාධන වාර්තාව**

පහත සඳහන් නිරීක්ෂණය සිදු කෙරේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2002 සැප්තැම්බර් 12 දිනැති අංක 402 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් මුදල් වර්ෂය අවසාන වී දින 150 ක් ඇතුළත සමාලෝචිත වර්ෂයට අදාළ කාර්යසාධන වාර්තාව පාර්ලිමේන්තුවේ සභා ගත කළ යුතුය. එම වාර්තාව පරික්ෂා කර බලා එහි සඳහන් සාවද්‍ය හෝ එකඟවීමට නොහැකි ප්‍රගතීන් පිළිබඳ පරික්ෂා කිරීම සඳහා සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සමඟ කාර්යසාධන වාර්තාව හෝ එහි කෙටුම්පතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. | මූල්‍ය ප්‍රකාශන සමඟ කාර්ය සාධන වාර්තාවේ පිටපතක් ලබා දීමට කටයුතු කිරිමට. | අංශ හා ප්‍රාදේශීය කාර්යාලවලින් තොරතුරු ලබා ගත යුතු වීමත් මහ බැංකු හා මුදල් අමාත්‍යාංශ වාර්තාවල තොරතුරු පදනම් කර ගත යුතු බැවින් කාර්ය සාධන වාර්තාව මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කළ නොහැකි වී ඇති බව. |

**3.3 දේශීය අරමුදල්වලින් ක්‍රියාත්මක කළ ව්‍යාපෘති**

පහත සඳහන් නිරීක්ෂණය සිදු කෙරේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලය නවීකරණය කිරීමට හා මහල් 9 කින් යුත් රථගාලක් ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුව රු.මිලියන 1,430.5 ක ගිවිසුම් ගත මුදලකට රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව වෙත පවරා දී තිබුණ අතර 2018 දෙසැම්බර් 31 දින වන විට ඉන් රු.මිලියන 1,399.7 ක මුදලක් සංස්ථාව වෙත ගෙවා තිබුණි. සංස්ථාව විසින් ගොඩනැගිල්ලේ නවීකරණ කටයුතු හා රථගාල ඉදිකිරීමට අදාළ සියලු කටයුතු උප කොන්ත්‍රාත් කරුවන්ට ලබා දී තිබුණි. ගිවිසුම් ගත පරිදි කාර්යන් නිම කිරීමේ ප්‍රගතිය පිළිබඳ අවධානයෙන් තොරව දෙපාර්තමේන්තුව විසින් සංස්ථාව වෙත මුදල් ගෙවා තිබීමත් සංස්ථාව විසින් උප කොන්ත්‍රාත් කරුවන් වෙත නියමිත පරිදි මුදල් ගෙවා නොතිබීමත් හේතුවෙන් නවීකරණ කටයුතු නිසි පරිදි ඉටු වී නොතිබුණ අතර රථවාහන අංගනය ද 2019 මැයි 15 දින වන විටත් වැඩ නිම කර දෙපාර්තමේන්තුව වෙත පවරා දීම සිදු කර නොතිබුණි. | කොන්ත්‍රාත් කරු වෙතින් අදාළ නවීකරණ කටයුතු හා රථගාලේ ඉදි කිරීම් කටයුතු කඩිනමින් කරවා ගැනීම සඳහා පියවර ගත යුතු බව. | රථ වාහන අංගනය ඉදි කිරීම සම්බන්ධයෙන් ජාතික ගොඩනැගිලි පර්යේෂණ ආයතනයෙන් වාර්තාවක් ලබා ගෙන ඇති බව සහ ඒ අනුව අංගනයේ වැඩ නිම කිරීමට කටයුතු කරන බව. |

## 3.4 ප්‍රසම්පාදනයන්

පහත සඳහන් නිරීක්ෂණය සිදු කෙරේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| දේශීය ආදායම් දෙපාර්තමේන්තුව සඳහා වර්ග අඩි 20,000-25,000 අතර ප්‍රමාණයේ ගොඩනැගිල්ලක් කුලී පදනම මත ලබා ගැනීම සඳහා ලංසු කැඳවා තිබුණි. ලංසු කරුවන් දෙදෙනෙකු පමණක් ලංසු ඉදිරිපත් කර තිබුණ අතර ඒවායේ ප්‍රමාණය වර්ග අඩි 25,000 ඉක්මවා තිබුණ බැවින් මුදල් අමාත්‍යාංශයේ අනුමැතිය මත කුලී පදනමට ලබා ගන්නා ගොඩනැගිල්ලේ ප්‍රමාණය වර්ග අඩි 30,025 දක්වා වැඩි කරවා ගෙන තිබුණි. ඒ අනුව, සංශෝධිත නව කොන්දේසි යටතේ ලංසු කැඳවා සැපයුම් කරුවෙකු තෝරා ගැනීමෙන් තොරව ප්‍රසම්පාදන මාර්ගෝපදේශයන්ට පටහැනිව පැරණි කොන්දේසි යටතේ කැඳ වූ ලංසු නව කොන්දේසි යටතේ ඇගයීම් කර රු.මිලියන 3.7 ක මාසික කුලිය යටතේ වර්ග අඩි 30,025 ගොඩනැගිල්ලක් 2018 අගෝස්තු 30 දින සිට වසරක කාලයක් සඳහා සපයා ගෙන තිබුණි. එහෙත් මෙම ගොඩනැගිල්ල තුල 2018 දෙසැම්බර් 31 දින දක්වාත් කිසිදු අංශයක් ස්ථාපිත කර නොතිබුණි. භාවිතයට නොගත් ගොඩනැගිල්ල වෙනුවෙන් කුලී ගෙවීම්, ආරක්ෂක සේවා ගාස්තු ලංසු කැඳවීමේ වියදම් ද ඇතුළුව සමාලෝචිත වර්ෂයේ දී එකතුව රු.මිලියන 5.08 ක් ගෙවා තිබුණ අතර එය නිෂ්කාර්ය වියදමක් වී තිබුණි. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය අනුව ප්‍රසම්පාදන කටයුතු කළ යුතු බව සහ රාජ්‍ය මුදල් ඵලදායීව හා කාර්යක්ෂමව උපයෝජනය කිරීමට හැකිවන පරිදි කළමනාකරණ තීරණ ගෙන කටයුතු කළ යුතු බව | දෙපාර්තමේන්තු අවශ්‍යතාවය මත තාක්ෂණ ඇගයීම් කමිටුවේ නිර්දේශ හා අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටු තීරණය මත තක්සේරු වාර්තා කැඳවා ගොඩනැගිල්ල කුලියට ගත් බව සහ විවිධ හේතු මත ගොඩනැගිල්ල තුල අංශ ස්ථාපිත නොවීම නිසා 2019 මාර්තු 13 දින ගොඩනැගිල්ල ආපසු භාර දී ඇති බව. |

**3.5 වත්කම් කළමනාකරණය**

පහත සඳහන් නිරීක්ෂණයන් සිදු කෙරේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| (අ) ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ල නවීකරණයේ දී දෙපාර්තමේන්තුවට සපයා දී තිබුණ ට්‍රාන්ස්පෝමර් යන්ත්‍ර 02 ක් 2010 වර්ෂයේ සිට 2019 මැයි 15 දක්වාත් භාවිතයට ගෙන නොතිබුණි.<br><br>(ආ) 2010 වර්ෂයේ දී රු.7,985,992 ක පිරිවැය දරා දෙපාර්තමේන්තුව තුල සවි කර ඇති CCTV කැමරා 70 ක් එදින සිට 2019 මැයි 15 දින දක්වාත් භාවිතයට ගෙන නොතිබුණි.<br><br>(ඇ) ප්‍රධාන කාර්යාල නවීකරණයේ දී ගිනි නිවීමේ උපකරණ කට්ටල ගොඩනැගිල්ල තුල සවි කර තිබුණ ද රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව විසින් ඒවායේ ක්‍රියාකාරීත්වය තහවුරු කර දෙපාර්තමේන්තුව වෙත භාර දී නොතිබුණි. | දෙපාර්තමේන්තුවේ අරමුණු හා කාර්යන් ඉටු කර ගැනීම සඳහා වත්කම් පූර්ණලෙස උපයෝජනය කළ යුතු බව. | වත්කම් භාවිතා කිරීම සඳහා කටයුතු කරමින් පවතින බව. |

**3.6 පාඩු හා හානි**

පහත සඳහන් නිරීක්ෂණයන් සිදු කෙරේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| (අ) 2006 අංක 12 දරන මුද්දර ගාස්තු (විශේෂ විධිවිධාන) පනතේ විධිවිධාන ප්‍රකාරව නිකුත් කල ගැසට් නිවේදන අනුව, මත්පැන් හා බෝතල් රා විකිණීම සඳහා වූ යම් වෙළදාමක් හෝ ව්‍යාපාරයක් කර ගෙන යාමට නිකුත් කරන බලපත්‍රයක් මත 2008 වර්ෂයේ සිට රු.10,000 ක් හා 2013 වර්ෂයේ සිට රු.20,000 ක් බැගින් වූ මුද්දර ගාස්තුවක් ප්‍රාදේශීය ලේකම් කාර්යාල හරහා අය කරවා ගත යුතු විය. 2018 ඔක්තෝබර් 01 දින සිට මත්පැන් බලපත්‍ර වර්ග 04 ක් හා බෝතල් රා බලපත්‍ර නිකුත් කිරීමේ දී බලපත්‍ර ගාස්තුවෙන් සියයට 10 ක් හෝ රු.2,000 යන දෙකෙන් වැඩි මුදල මුද්දර ගාස්තු ලෙස අය කළ යුතු බවට විෂය භාර අමාත්‍යවරයා විසින් ගැසට් නිවේදනයක් මඟින් නියෝග කර තිබුණි. එහෙත් එම නියෝග නිකුත් කිරීමට පෙර රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයෙකුගේ හා දේශීය ආදායම් | 2008 වර්ෂයේ සිට 2018 ඔක්තෝබර් 1 දක්වා වූ කාල පරිච්ඡේදයට අදාළ ඡේදයේ සඳහන් බලපත්‍ර මත අය විය යුතු මුද්දර බදු ආදායම කඩිනමින් අය කර ගැනීම සඳහා කටයුතු කළ යුතු බව. | අදාළ හිඟ මුද්දර ගාස්තු අය කර ගැනීම සඳහා උපදෙස් ඇතුළත් චක්‍රලේඛයක් කෙටුම්පත් කර ඇති බව. |

| | | |
|---|---|---|
| කොමසාරිස් වරයෙකුගේ උපදෙස් පරිදි 2008 වර්ෂයේ සිට මෙම ගැසට් නිවේදනය නිකුත් කළ දිනය දක්වා මත්පැන් බලපත්‍ර වර්ග 04 ක් සඳහා හා බෝතල් රා සඳහා බලපත්‍ර නිකුත් කිරීමේ දී අදාළ වර්ෂයේ පැවති අනුප්‍රමාණ යටතේ මුද්දර ගාස්තු අය කර නොතිබුණ අවස්ථා නිරීක්ෂණය විය. ඒ අනුව සමාලෝචිත කාල සීමාව තුල විශාල මුද්දර බදු ආදායමක් රජයට අහිමි වී තිබුණි. | | |
| (ආ) බදුකරුවන් විසින් දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට ලබා දෙනු ලබන චෙක්පත් අහරු වීමේ ප්‍රවණතාව ඉහළයමින් පැවතිය ද එය නිවැරදි කිරීමට ප්‍රමාණවත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. අහරු චෙක්පත් සඳහා මුදල් අය කර ගැනීමේ දී ද මන්දගාමී ස්වරූපයෙන් කටයුතු කර ඇති බව නිරීක්ෂණය විය. 2018 දෙසැම්බර් 31 දිනට මෙලෙස අහරු වී පැවති චෙක්පත් සංඛ්‍යාව 7,295 ක් වූ අතර ඒවායේ වටිනාකම රු.මිලියන 2,550 ක් විය. | අහරු චෙක්පත්වලට අදාළ බදුකරුවන් පිළිබඳ විධිවිධාන ප්‍රකාරව සොයා බලා අවශ්‍ය පියවර ගත යුතු බව සහ අහරු චෙක්පත් සඳහා මුදල් අයකර ගැනීමට කඩිනම් පියවර ගත යුතු බව. | අහරු චෙක්පත් සඳහා මුදල් අය කර ගැනීමේ කටයුතු සිදුවන බව. |

**3.7 අවිධිමත් ගනුදෙනු**

පහත සඳහන් නිරීක්ෂණයන් සිදු කෙරේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) 2008 දෙසැම්බර් 24 දිනැති අමප/08/2253/338/043 දරන අමාත්‍ය මණ්ඩල තීරණයට අනුව දෙපාර්තමේන්තුව විසින් වෙළඳ දැන්වීම් හා ප්‍රචාරණාත්මක වැඩසටහන් සැලසිනෙ ආයතනය වෙතින් ඉටු කරවා ගත යුතු වුවත් නව දේශීය ආදායම් බදු පනත ක්‍රියාත්මක කිරීමට අදාළ ප්‍රචාරණ කටයුතු එම ආයතනයෙන් ඉටු කරවා ගෙන නොතිබුණි. ඒ වෙනුවට රු.93,064,697 ක පිරිවැය වූ සියලුම මුද්‍රිත හා විද්‍යුත් ප්‍රචාරණ කටයුතු දෙපාර්තමේන්තු ප්‍රචාරණ කමිටුවක් හා ප්‍රසම්පාදන කමිටුවක් මඟින් ප්‍රචාරණ ආයතන තෝරා ගෙන ප්‍රචාරණ කටයුතු සිදු කර තිබුණි. | අමාත්‍ය මණ්ඩල තීරණ ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් කටයුතු කළ යුතු බව. | සැලසිනේ ආයතනය ඉදිරිපත් කළ වැඩ පිළිවෙල දෙපාර්තමේන්තුවට නොගැලපීම, සැලසිනේ ආයතනය මිල ගණන් දැනුම් දී නොතිබීම, සෘජුවම මාධ්‍ය ආයතන හරහා සිදු කිරීමේ දී පිරිවැය අඩු කර ගත හැකි වීම වැනි කරුණු සැලකිල්ලට ගෙන දෙපාර්තමේන්තුව විසින් ප්‍රචාරණ කටයුතු සිදු කිරීමට තීරණය කළ බව. |
| (ආ) වියදම් කළමනාකරණය සම්බන්ධයෙන් ජනාධිපති ලේකම් කාර්යාලය මඟින් නිකුත් කරන ලද 2006 ජනවාරි 04 දිනැති | වියදම් කළමනාකරණය සම්බන්ධයෙන් ජනාධිපති ලේකම් කාර්යාලය විසින් | අවම පිරිවැයක් දරමින් උපරිම ප්‍රතිලාභ ලබා ගත හැකි පරිදි ප්‍රසම්පාදන ක්‍රියාවලින් හා මුදල් |

| | | |
|---|---|---|
| සීඑස්ඩී/81/40 දරන ලිපිය හා ඊට අදාළව වරින් වර නිකුත් කළ ලිපි අනුව, අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් පවත් වනු ලබන වැඩමුළු හා සම්මන්ත්‍රණ පැවැත්වීම සඳහා හෝටල් තෝරා නොගත යුතු බව දන්වා තිබුණි. එහෙත් දෙපාර්තමේන්තුව විසින් නව බදු පනත පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් 15 ක් රු.21,582,215 ක් වැය කර හෝටල් හා උත්සව ශාලාවල පවත්වා තිබුණි. | නිකුත් කළ උපදෙස් පරිදි දෙපාර්තමේන්තුව කටයුතු කළ යුතු බව. | රෙගුලාසි අනුගමනය කරමින් හෝටල්වල දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත් වූ බව. |
| (ඇ) නව බදු පනත පිළිබඳ දැනුවත් කිරීමේ දේශන හා සම්මන්ත්‍රණ පැවැත්වීමේ දී දෙපාර්තමේන්තුව විසින් ප්‍රවේශ පත්‍ර අලෙවි කර රු.7,240,500 ක් රැස් කර රාජ්‍ය ආදායමට බැර කර තිබුණි. එසේ ආදායම් රැස් කිරීම සඳහා දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් වෙත බලය ලබා දීමට අදාළ ලිපි විගණනයට ඉදිරිපත් නොවීය. | ආදායම් රැස්කිරීම සඳහා වන විධිමත් අනුමැතින් ලබා ගැනීමෙන් තොරව ආදායම් රැස් නොකළ යුතු බව. | දැනුවත් කිරීමේ වැඩසටහන් සාර්ථක කර ගැනීම සඳහා ප්‍රවේශ පත්‍ර අලෙවි කළ බව. |

**3.8 විගණන විමසුම්වලට පිළිතුරු ලබා නොදීම**

පහත සඳහන් නිරීක්ෂණය සිදු කෙරේ.

| <u>විගණන විමසුම පිළිබඳ විස්තරය</u> | <u>නිර්දේශය</u> | <u>ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම</u> |
|---|---|---|
| එකතු කළ අගය මත බදු අය කිරීම සම්බන්ධයෙන් නිකුත් කළ විගණන විමසුම් 06 ක් සඳහා මාස 03 ක් ඉක්ම යන තුරුත් අවසන් පිළිතුරු ලබා දී නොතිබුණි. | විගණන විමසුම් මඟින් පෙන්වා දී ඇති කරුණු සම්බන්ධයෙන් කටයුතු කර කඩිනමින් අවසන් පිළිතුරු ලබා දිය යුතු බව. | අතුරු පිළිතුරු ලබා දී ඇති බව සහ විමසුමේ කරුණු සම්බන්ධයෙන් තව දුරටත් පරීක්ෂණ කටයුතු සිදු කරමින් පවතින බව. |

## 3.9 කළමනාකරණ දුර්වලතා

පහත සඳහන් නිරීක්ෂණයන් සිදු කෙරේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| (අ) 2010 අංක 16 දරන ගෙවීම් පැහැර හරිනු ලැබූ බදු පියවීමේ (විශේෂ විධිවිධාන) පනතේ විධිවිධාන ප්‍රකාරව නව අංශයක් ස්ථාපිත කර 2009 දෙසැම්බර් 31 දිනට පැහැර හැර තිබුණු රු.බිලියන 125.2 හිඟ බදු හා දඩ මුදලක් නිරවුල් කිරීමේ වගකීම පවරා තිබුණි. තවද, 2014 අංක 14 දරන ගෙවීම් පැහැර හරිනු ලැබූ බදු පිය වීමේ (විශේෂ විධිවිධාන) සංශෝධන පනත මඟින් මෙම හිඟ බදු අය කර ගැනීම සඳහා වූ අතිරේක විධිවිධාන සලසා තිබුණි. අදාළ අංශය ස්ථාපිත කර වසර 8 ක් ගත වී තිබුණ ද සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් තව දුරටත් නිරවුල් කල යුතු එකතුව රු.බිලියන 32.5 හිඟ බදු හා දඩ මුදලක් පැවති බව නිරීක්ෂණය විය. | පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කර පැහැර හැර ඇති බදු මුදල කඩිනමින් නිරවුල් කිරීමට කටයුතු කළ යුතු බව. | පනතේ විධිවිධාන ප්‍රකාරව 2014 දෙසැම්බර් 12 දිනෙන් පසුව බදු උපදේශන කමිටුව පත් කර නොතිබුණ බැවින් නිරවුල් කිරීමේ කටයුතු ප්‍රමාද වී ඇති බව. |
| (ආ) නියැදි විගණන පරීක්ෂාවේ දී අනාවරණය වූ පරිදි දෙපාර්තමේන්තුව විසින් එකතු කිරීමේ අගය මත බදු රැස් කිරීම අක්‍රීය කළ බදු කරුවන් 13 දෙනෙකු අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු 9 කින් රු.මිලියන 1.48 ක පමණ එකතු කළ අගය මත බදු මුදලක් රැස් කර තිබුණ ද බදු වාර්තා ඉදිරිපත් කිරීම හෝ දෙපාර්තමේන්තුව වෙත බදු මුදල් ප්‍රේෂණය කිරීමක් හෝ සිදු කර ද නොතිබුණි. අක්‍රීය බදුකරුවන් විසින් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තුවලින් එකතු කළ අගය මත බදු මුදල් එකතු කිරීම වළක්වා ගැනීම සඳහා නව පරිගණක පද්ධතිය තුල ද ක්‍රම වේදයක් ස්ථාපිත වී නොතිබුණ බව නිරීක්ෂණය විය. | අක්‍රීය බදු කරුවන් විසින් බදු මුදල් රැස් කිරීම නතර කිරීමට විධිමත් පියවරක් ගත යුතු බව. සියලුම අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තුවලින් බදු කරුවන් රැස් කරන එකතු කළ අගය මත බදු මුදල් බදු වාර්තාවල නිසි පරිදි වාර්තා කරන බව පරීක්ෂා කිරීම සඳහා ක්‍රම වේදයක් ස්ථාපිත කළ යුතු බව. | අතුරු පිළිතුරු ලබා දී ඇති බවත් විමසුමේ කරුණු සම්බන්ධයෙන් තවදුරටත් පරීක්ෂණ කටයුතු සිදු කරමින් පවතින බව. |
| (ඇ) එකතු කළ අගය මත බදු සම්බන්ධයෙන් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කළ තොරතුරු නියැදියක්, දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ පරිගණක පද්ධතියේ තොරතුරු සමඟ පරීක්ෂා කිරීමේ දී සක්‍රීය බදුකරුවන් 293 දෙනෙකු විසින් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු මඟින් රැස් කළ රු.මිලියන 66.19 ක එකතු කළ අගය මත | සියලුම අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තුවලින් බදු කරුවන් රැස් කරන එකතු කළ අගය මත බදු මුදල් බදු වාර්තාවල නිසි පරිදි වාර්තා කරන බව පරීක්ෂා කිරීම සඳහා ක්‍රම වේදයක් ස්ථාපිත කළ යුතු බව. | |

| | | |
|---|---|---|
| බදු මුදල්, දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත ලබා දෙන බදු වාර්තාවල අනාවරණය කර ඇති බවක් තහවුරු නොවීය. මෙම තත්ත්වය අනාවරණය කර ගෙන විධිමත් පියවර ගැනීම සඳහා වූ ක්‍රමවේදයක් නව පරිගණක පද්ධතිය තුල ද ස්ථාපිත වී නොතිබුණි. | | |
| (ඇ) නව බදු පරිපාලන පද්ධතිය යටතේ පරිපාලනය වන බදු වර්ග 04 කට අදාළව 2016 ජනවාරි 01 සිට 2018 ජුනි 30 දක්වා බදු කරුවන් වෙත ආපසු ගෙවිය යුතු බදු ඉල්ලීම් 17,028 ක් පැවති අතර ආපසු ගෙවිය යුතු බදු මුදල රු.මිලියන 15,334.5 ක් විය. ඒ අතරින් 2019 අප්‍රේල් 30 දින වන විට බදු ආපසු ගෙවීම් 5,078 ක් සඳහා කටයුතු කිරීමට පද්ධතිය ඇසුරින් නිලධාරීන් වෙත වැඩ අයිතම නිකුත් වී තිබුණි. එසේ යොමු කළ වැඩ අයිතම අතරින් 2019 මැයි 14 දින වන විට චෙක්පත් මඟින් ආපසු ගෙවීම් 25 ක් ද ඇතුළත්ව බදු ආපසු ගෙවීම් 212 ක් පමණක් නිම කර තිබුණ බව නිරීක්ෂණය විය. | බදු ආපසු ගෙවීම් ප්‍රමාද වීමට බලපා ඇති කරුණු සොයාබලා පරිගණකගත බදු පරිපාලන පද්ධතිය ඇසුරින් ප්‍රමාදයකින් තොරව බදු ආපසු ගෙවීම සිදු කළ හැකි වන පරිදි ක්‍රියාවලිය විධිමත් කළ යුතු බව. | සියළුම නිවේදන සඳහා බදු ආපසු ගෙවීම් සිදු කළ යුතු නොවන බවත්, ගෙවීම් කටයුතු සිදු කළ යුතු ඉල්ලීම් 5,078 ක් සඳහා පද්ධතිය මඟින් නිලධාරීන් වෙත වැඩ අයිතම යොමු කර ඇති බවත්, සාධාරණ කාලයක් තුල දී තොරතුරු ඉදිරිපත් නොකරන බදුකරුවන්ගේ බදු ආපසු ගෙවීම් අවලංගු කරන බව. |

**4. තිරසර සංවර්ධන අරමුණු ළඟා කර ගැනීම**

පහත සඳහන් නිරීක්ෂණය සිදු කෙරේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| තිරසර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර 2030 "න්‍යාය පත්‍රය" ප්‍රකාරව සෑම රාජ්‍ය ආයතනයක් විසින්ම කටයුතු කළ යුතුව පවතින අතර සමාලෝචිත වර්ෂයට අදාළව දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් තම විෂය පථයට ගැනෙන කාර්යයන් සම්බන්ධයෙන් ක්‍රියාත්මක වී නොතිබුණි. | තිරසර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර 2030 "න්‍යාය පත්‍රය" ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් කටයුතු කළ යුතු බව. | මේ සම්බන්ධයෙන් කටයුතු කිරීම සඳහා අදාළ අමාත්‍යාංශයෙන් විමසීම් කර ඇති බව. |

**5. මානව සම්පත් කළමනාකරණය**

පහත සඳහන් නිරීක්ෂණයන් සිදු කෙරේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) 2018 දෙසැම්බර් 31 දිනට දෙපාර්තමේන්තුවේ මුළු පුරප්පාඩු සංඛ්‍යාව 188 ක් වූ අතර එය අනුමත සේවක සංඛ්‍යාවෙන් සියයට 6.7 ක් විය. ඒ අතරින් දේශීය ආදායම් සේවයේ පුරප්පාඩු 101 ක් වූ අතර එය දේශීය ආදායම් සේවයේ අනුමත තනතුරු සංඛ්‍යාවෙන් සියයට 8 ක් විය. නව පරිගණක පද්ධතිය අනුව නිර්මාණය වන වැඩ අයිතම නිලධාරීන් වෙත යොමුවන අතර නිලධාරීන්ගේ පුරප්පාඩු පැවතීම එම වැඩ අයිතම නිම කිරීම කෙරෙහි බලපාන බව විගණනයට නිරීක්ෂණය විය. | පුරප්පාඩු පිරවීම සඳහා කඩිනමින් පියවර ගත යුතු බව. | දේශීය ආදායම් සේවයේ III ශ්‍රේණියේ පුරප්පාඩු 71 ක් පිරවීම සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය ඉල්ලා ඇති බව. |
| (ආ) නියැදි විගණන පරීක්ෂාවේ දී අනාවරණය වූ පරිදි දෙපාර්තමේන්තුවේ නිලධාරියෙකු සමාලෝචිත වර්ෂයේ ප්‍රථම අර්ධ වර්ෂය තුල දී, 2009 අප්‍රේල් 16 දිනැති අංක 9/2009 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය අනුව තම පැමිණීම හා පිටවීම ඇඟිලි සලකුණු යන්ත්‍රයේ සටහන් කර නොතිබුණි. එමෙන්ම තවත් නිලධාරීන් තිදෙනෙකුගේ දින 25 කට වඩා වැඩි දින ගණනක් ඇඟිලි සලකුණු යන්ත්‍රය අනුව පැමිණීම/පිටවීම තහවුරු නො වූ අවස්ථා විය. එහෙත් මෙම තත්ත්වය පිළිබඳ අවධානය යොමු කිරීමෙන් තොරව අදාළ නිලධාරීන් සඳහා 2018 පළමු අර්ධ වර්ෂයේ දිරි දීමනා ගෙවා ඇති බව ද නිරීක්ෂණය විය. | චක්‍රලේඛය ප්‍රකාරව සියලුම නිලධාරීන් කටයුතු කළ යුතු බව හා එසේ කටයුතු කර නොමැති නිලධාරීන් සම්බන්ධයෙන් විධිමත් පියවර ගත යුතු බව | ඇඟිලි සලකුණු යන්ත්‍රය භාවිතා කිරීම සම්බන්ධයෙන් අභ්‍යන්තර චක්‍රලේඛයක් නිකුත් කර උපදෙස් ලබා දී ඇති බව. |